# 2022 මැයි මස මාසික සභා රැස්වීම

## වැලිගෙපොල ප්‍රාදේශීය සභාව

2022 මැයි මස මාසික සභා රැස්වීම 2022.05.23 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පවත්වනු ලැබීය.

එදින සභා රැස්වීමට පහත නම් සඳහන් අය සහභාගී වූහ.

| | | |
|---|---|---|
| 1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා |
| 2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා |
| 3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී.බුද්ධික විරසිංහ මැතිතුමා |
| 4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී.එච්.සිරිපාල මැතිතුමා |
| 5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එල්.ඒ.ගුණතිලක මැතිතුමා |
| 6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.ආර්.රත්නපාල මැතිතුමා |
| 7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා |
| 8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.ඒ.දමිත් විජේරත්න මැතිතුමා |
| 9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා |
| 10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | එන්.වී.ශ්‍රීමාවති මැතිතුමිය |
| 11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | පී.ජී.ශාන්ත දෙල්ගහකොට්ටුව මැතිතුමා |
| 12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී.කේ.ප්‍රසාද් අසිත මැතිතුමා |
| 13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ඒ.ඩබ්ලිව්.සුමනාවතීමැතිතුමිය |
| 14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | පී.ආර්.එස්.ධම්මිකා මැතිතුමිය |
| 15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එන්.ජී.යූ.ඩබ්ලිව්.කුමාර මැතිතුමා |

## නිලධාරී සහභාගීත්වය

| | | |
|---|---|---|
| 1. ප්‍රාදේශීය සභාවේ ලේකම් | - | එස්.එච්.ඒ.කරුණාරත්න මිය |
| 2. කළමනාකරණ සේවා නිලධාරී | - | එච්.ඒ.පී.එන්.හෙට්ටිආරච්චි මිය |

මෙදින සභා රැස්වීමට සහභාගී වූ ගරු සභාපති තුමා විසින් මන්ත්‍රී මණ්ඩලයත්,ලේකම් තුමිය ඇතුළු කාර්යමණ්ඩලයත්,මාධ්‍යවේදී මහතාත් පිළිගැනීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

### 1. පසුගිය සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම

2022.04.07 වන දින මාසික සභා රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

## 2. ගරු සභාපතිතුමාගේ නිවේදන

### 2.1. ජල බිල් පතේ නම සංශෝධනය කිරීම

- පී.වී.ජී.ජයසේන නමින් ඇති අංක NG – 701 දරණ ජල බිල් පත පී.වී.ජී.සංජීව පුෂ්ප කුමාර නමින් සංශෝධනය වන බව සභාවේ දැනගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.
- ඒ.ඩබ්.සෝමරත්න නමින් ඇති අංක PL-158 දරණ ජල බිල් පත ඒ.ඩබ්.මේබල මධුර සෝමරත්න නමින් සංශෝධනය වන බව සභාවේ දැනගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.
- එම්.ඩී.අමිල සඳරුවන් නමින් ඇති අංක NG - 712 දරණ ජල බිල් පත එච්.ඩබ්.ටී.එන්. ජයරත්න නමින් සංශෝධනය වන බව සභාවේ දැනගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

## 3. සභාව නමින් ලැබී ඇති ලිපි,පෙත්සම් හා පැමිණිලි ඉදිරිපත් කිරීම

### 3.1. නිවාඩු අනුමත කර ගැනීම.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්ලිව්.ඒ.සමන්ජීවලාල් වීරසිංහ මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී අචිනි එස්.අබේවික්‍රම මැතිතුමිය , සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.ඉන්ද්‍රජිත් සමන්ජීව මැතිතුමා අසනීප වීම හේතුවෙන් අද දින සභා රැස්වීමට සහභාගී නොවන බව දන්වා එවා ඇති බැවින්,නිවාඩු අනුමත කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා විසින් යෝජනා කිරීමෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ආර්.එස්.ධම්මිකා මැතිතුමිය විසින් ස්ථිර කිරීමෙන් පසුව එම නිවාඩු අනුමත විය.

## 4. යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න

යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න කිසිවක් නොවීය

## 5. කල් දී ඇති යෝජනා

### 5.1. ගරු සභාපති කැඑම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමා

ගරු සභාපතිතුමා විසින් පහත සඳහන් යෝජනා සභාවට ඉදිරිපත් කරන ලදී.

I. ඒන්.ජී.නාලක සිසිර කුමාර මහතා විසින් නව ජල සැපයුමක් ලබා ගැනීම වෙනුවෙන් 2022.01.18 වන දින රු.10500.00 ක මුදලක් සභාව වෙත ගෙවා ඇති අතර එම ජල සබඳතාවය අවශ්‍ය නොවන බව පවසමින් ඉහත මුදල් ආපසු ලබා දෙන ලෙස ඔහු විසින් ඉල්ලීමක් කර ඇති බැවින් එම මුදල් ආපසු ලබාදීම සඳහා සභා අනුමතිය අවශ්‍ය බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

II. රු.250,000.00 දක්වා වූ කාර්යාලීය ප්‍රසම්පාදන කමිටුව ලෙස, ගරු සභාපති,ලේකම්,කාර්මික නිලධාරී,ප්‍රධාන සංවර්ධන නිලධාරී,අංශ ප්‍රධානීන්,පුස්තකාලයාධිපති සහ ආයුර්වේද වෛද්‍ය නිලධාරී, පත් කිරීම සුදුසු බවට ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ.ගුණතිලක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.විරෝධතා කිසිවක් නොවූ හෙයින් එම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

III. රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2021 අනුව ත්‍රී පුද්ගල කමිටුව පත්කර ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්.කුමාර මැතිතුමා විසින් ස්ථිරය කරමින් එම කමිටුව පිළිබඳ පැහැදිලි කිරීමක් සිදු කරන ලෙස ඉල්ලා සිටියේය.

ඒ අනුව, ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්.කුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත්කරන ලදී.

ලේකම්තුමියගේ කරුනු පැහැදිලි කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

අනතුරුව ඒ සම්බන්ධව අදහස් දක්වමින් ගරු සභාපතිතුමා රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2021 අනුව ත්‍රී පුද්ගල කමිටුව පත්කර ගැනීමේ අවශ්‍යතාව පෙන්වා දෙන ලදී. ඒ අනුව, ගරු සභාපතිතුමා සහ ප්‍රාදේශීය ලේකම් විසින් නම් කරනු ලබන නියෝජිතයින් දෙදෙනෙකුගෙන් සමන්විත ත්‍රිපුද්ගල කමිටුව සඳහා වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

IV. සභාවේ කාර්ය කර්තව්‍යයන් පහසු කිරීම පිණිසත්, බල ප්‍රදේශය තුල සිටින ජනතාවට සේවා සැපයීමේදී විදිමත් කිරීම පිණිසත් අවශ්‍ය උපදේශනය ලබා ගැනීම සඳහා බල ප්‍රදේශයේ සිටින විද්වත් මණ්ඩලයක් සංවර්ධන උපදේශන කාරක සභාව ලෙස පත්කර ගැනීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.ඒ අනුව,

ඹපනායක හා වැලිගෙපොල නියෝජනය වන පරිදි,

- ශාසනාරක්ෂක බල මණ්ඩලයේ නියෝජනය කරමින්,
  - පූජ්‍ය පනානේ විජේවංශ හිමි,
  - පූජ්‍ය මාදොල සෞගත හිමි,
  - පූජ්‍ය හටංගල ධම්මවංශ හිමි,
  - පූජ්‍ය මොරහැල උත්තරානන්ද හිමි,
- ර/විද්‍යාකර ඉසුරු මහා විද්‍යාලයේ විදුහල්පති උපුල් වතුකාරවත්ත මායා.
- ර/ධර්මරාජ මහා විද්‍යාලයේ විදුහල්පති එන්.කේ.හෙට්ටිආරච්චි මයා.
- ර/වළගම්බා මහා විද්‍යාලයේ විදුහල්පති ආනන්ද සමරකෝන් මයා.
- ර/අඹැවිල විද්‍යාලයේ විදුහල්පති සනත් නන්දසිරි මයා.
- ව්‍යාපාරික ගාමිණී වෙල්ලාල මයා,
- ගොවිජන සමිති නියෝජනය කරමින් එම්.ජී.පත්මලාල් උදයසිරි මයා,

ලෙස කමිටුවේ සංයුතිය තීරණය වූ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

V. වැලිගෙපොළ ප්‍රාදේශීය සභාවේ කාර්ය හා කර්තව්‍යයන් ට අදාලව රු.50,000.00 සිට රු.500,000.00 දක්වා වූ සියලු වියදම් අනුමත කිරීම, රු.50,000.00 සිට රු.500,000.00දක්වා ඇස්තමේන්තු අනුමත කිරීම, ගරු සභාපතිවරයා විසින් සිදු කරනු ලබන රු.50,000.00 දක්වා වූ වියදම් සඳහා ආවරණ අනුමැතිය ලබාදීම, නිවාස සහ ප්‍රජා සංවර්ධන කමිටුව, කාර්මික සේවා කමිටුව සහ පරිසරය හා පහසුකම් කමිටුව නිර්දේශ කරනු ලබන රු.50,000.00 සිට රු.500,000.00 දක්වා වූ වියදම් සඳහා අනුමැතිය ලබා දීම, රු. 250,000.00 සිට රු.500,000.00 දක්වා වූ ප්‍රසම්පාදන කමිටුව ලෙස ක්‍රියා කිරීම, ප්‍රාදේශීය සභා පනත/ රාජයේ විවිධ රෙගුලාසි/ චක්‍රලේඛ /අතුරු අවස්ථා හා රීතීන් වලට අනුකූල වන පරිදි ආදායම් ඒකරාශී කිරීම, වියදම් කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය වගවීම සහ පාලනය කිරීම, මූල්‍ය ස්ථාවරත්වය ගොඩනැගීම සඳහා වන යෝජනා ගරු සභාවට ඉදිරිපත් කිරීම හා ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් බලතල ක්‍රියාත්මක කිරීම උදෙසා 2018 වර්ෂයේ මහා සභා විසින් ලබාදුන් බලාධිකාරය තවදුරටත් වලංගු වන පරිදි මුදල් කමිටුවට බලය පැවරීම සුදුසු බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේම කුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

VI. සභාවේ රු.500,000.00 සීමාව ඉක්මවන වියදම් සඳහා ප්‍රසම්පාදන කමිටුව ලෙස සභාවේ සියලුම ගරු මන්ත්‍රීවරුන් පත්කර ගැනීම සුදුසු බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.රත්නපාල මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

VII. පෙරටු කාර්යාලය සකස් කිරීම සඳහා 2022.04.07 වන දින පැවති ප්‍රසම්පාදන කමිටුවේ තීරණ අනුව සීගිරි සමුදි ෆනිචර් වෙතින් සිදු කිරීමට තීරණය වූ අතර ඒ සඳහා ඔවුන් විසින් ඉදිරිපත් කල ,රු.1,427,922.00 ක මිල ගණන් අනුමත කිරීම සුදුසු බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් ස්ථිරකිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

VIII. අවස්ථානුකූලව තාක්ෂණික ඇගයීම් කමිටුව පත් කිරීම සඳහා ගරු සභාපතිතුමාට බලය පැවරීම සුදුසු බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා ,විවිධ මිලදී ගැනීම් වලදී අවශ්‍ය තාක්ෂණික උපදෙස් ගැනීම සඳහා අවස්ථානුකූලව ඒ හා සම්බන්ධ විශේෂ දැනුමක් සහිත පුද්ගලයින්ගෙන් සැදුම් ලත් කමිටුවක් පත්කර ගැනීමට මෙම යෝජනාව සිදු කල බව සඳහන් කළේය.ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

IX. ඉන්ධන මිල අධික ලෙස ඉහළ යාම හේතුවෙන් සභාව සතු JCB යන්ත්‍රය හා ජල බවුසර් වල ගාස්තු පහත පරිදි සංශෝධනය කිරීම අවශ්‍ය බව යෝජනා කරන ලදී.

- ජල බවුසරය කුලියට දීම - 3000.00

(සභා කාර්යාලයේ සිට කි.මී.01 ක් ඇතුලත රු.3000.00 ක් ලෙසත් , ඉන් බැහැරව වැඩිවන සෑම කි.මී.01 ක් සඳහා රු200.00 ක් ලෙසත් ගෙවිය යුතුය.)

- ජල බවුසරය රඳවා ගන්නේ නම් එක් දිනකට අය කිරීම -රු .500.00
- ජේ.සී.බී.යන්ත්‍රය කුලියට දීම (යන්ත්‍ර පැය 1ක සඳහා) -රු. 4250.00
  යම් හෙයකින් මීටරය අක්‍රීය වුවහොත් දිනකට ජේ.සී.බී.යන්ත්‍ර කුලිය - රු. 34,000.00

ඒ අනුව , ඉහත ගාස්තු සංශෝධන යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්.කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

X. රැස්වීම් ශාලාව කුලියට දීමේ ගාස්තු හා හෙල බොජුන්හල සේවා සැපයීම් සම්බන්ධ ගාස්තු පහත පරිදි සංශෝධනය කිරීම අවශ්‍ය බව යෝජනා කරන ලදී.

රැස්වීම් ශාලාව කුලියට දීම (දිනකට)

- උත්සව අවස්ථා සඳහා - රු.25000.00
- අලෙවි ප්‍රදර්ශන කටයුතු සඳහා - රු.10000.00
- රැස්වීම් කටයුතු සඳහා - රු.10000.00 (වරුවකට රු.5000.00)
- පෙර පාසල් / පාසල් උත්සව සඳහා - රු.10000.00
- වෙනත් කටයුතු සඳහා පැයකට - රු. 1000.00

හෙල බොජුන්හල සේවා සැපයීම

- විවෘත අලෙවි ප්‍රදර්ශන කුටි සඳහා (දිනකට) - රු.500.00

එක් කඩකාමරයකින් අයකරන ගාස්තු

- මාසික ස්ථාවර ගාස්තුව - රු.500.00
- එක් දිනකට අයකරන මුදල - ආදායමින් 5% ක්(පළමු මාස 6 තෙක්)

ඒ අනුව,ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.දමිත් විජේරත්න මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

XI. ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ තොරතුරු තාක්ෂණ සංනිවේදන ශිල්පි (NVQ 4) පාඨමාලාව සාර්ථකව නිම කරන ලද දෙනිපල්ල,අකරල, ඕපනායක ලිපිනයෙහි පදිංචි පී.ලක්ෂි වරුනිකා මහින්දි මෙනවියට මෙම සභාවේ මාස 06ක ආයතනික පුහුණුවක් ලබා දීම සුදුසු බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

XII. කසල මධ්‍යස්ථානයට තෙකලා විදුලිය ලබා ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

XIII. රු.50,000.00 ඉක්මවන කාර්යාලීය දුරකථන බිල්පත්,ඉන්දන බිල්,වැටුප්,මන්ත්‍රී දීමනා,විදුලි බිල්පත්,පුවත්පත් බිල් සභාවේ / මුදල් කමිටුවේ ආවරණ අනුමැතියට යටත්ව වියදම් ගෙවීමට ගරු සභාපතිවරයාට බලය පැවරීම සුදුසු බව යෝජනා කරන ලදී.
එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

6. **<u>කාරක සභා වාර්තා සලකා බැලීම.</u>**

## 6.1. 2022.04.22 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තා

2022.04.22 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභා වාර්තාව මහා සභාවේ සලකා බැලීම පිණිස ඉදිරිපත් කරන ලදී.

## 6.2. 2022.04.07 වන දින ප්‍රසම්පාදන වාර්තාව

2022.04.07 වන දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව මහා සභාවේ සලකා බැලීම පිණිස ඉදිරිපත් කරන ලදී.

7. **ආදායම් වියදම් වාර්තා**

## 7.1. 2022 මාර්තු මස ආදායම් වියදම් වාර්තාව

| ලැබීම් සාරාංශය | (රුපියල්) | වැය සාරාංශය | (රුපියල්) |
|---|---|---|---|
| වරිපනම් බදු | 760,332.16 | වැටුප් හා දීමනා | 4,230,922.31 |
| කුලී | 133,381.93 | ගමන් වියදම් | 93,942.00 |
| බලපත්‍ර ගාස්තු | 495,250.00 | සැපයුම් හා උපකරණ | 632,649.41 |
| සේවා සඳහා ගාස්තු | 35,800.00 | ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තුව | 159,171.08 |
| වරෙන්තු ගාස්තු හා දඩ | 507,673.67 | ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 302,422.43 |
| වෙනත් ආදායම් | 45,100.15 | පොලී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් | - |
| වෙනත් ආධාර | 3,814,323.73 | ආධාර මුදල් දායක මුදල් සහනාධාර | - |
| පුනරාවර්ථන ආදායම් එකතුව | 5,791,861.64 | විශ්‍රාම වැටුප්,විශ්‍රාම ප්‍රතිලාභ,හා පාරිතෝෂික | 17,973.86 |
| මූලධන ලැබීම් | - | පුනරාවර්තන වියදම් එකතුව | 5,437,081.09 |
| ප්‍රාග්ධන ආදායම් එකතුව | - | ප්‍රාග්ධන වැය | 46,040.00 |
| පුනරාවර්ථන/ ප්‍රාග්ධනආදායම් එකතුව | 5,791,861.64 | ණය ආපසු ගෙවීම් | - |
| සේවක ණය | 69,564.67 | සේවක ණය | - |
| තැන්පත් | 358,954.25 | තැන්පත් | 382,746.46 |
| අත්තිකාරම් | 40,000.00 | ණයහිමි | 1,124,695.85 |
| ණය ගැති(කර්මාන්ත) | - | අත්තිකාරම් | 90,000.00 |
| සමුච්චිත අරමුදල | - | ජල ගබඩා | 180,775.00 |
| | | ගබඩා(ඖෂධ) | 49,880.00 |
| වෙනත් ලැබීම් එකතුව | 468,518.92 | සමුච්චිත අරමුදල | 47,355.00 |
| | | වෙනත් ගෙවීම් | - |
| | | වෙනත් ගෙවීම් එකතුව | 1,875,452.31 |
| මුළු එකතුව | 6,260,380.56 | මුළු ගෙවීම් | 7,358,573.40 |

## 7.2. 2022 මාර්තු 31 දිනට ආදායම් අය කිරීමේ ප්‍රගති වාර්තා

ඇමුණුම 1 යා කර ඇත.

## 8. පසු ගිය සභා රැස්වීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම

- පසුගිය සභා රැස්වීමට ඉදිරිපත් වූ යෝජනා විෂය නිලධාරීන් වෙත යොමුකර ඇති බව,ප්‍රකාශ කරන ලදී.

## 9. වෙනත් කරුණු

### 9.1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.ශාන්ත දෙල්ගහකොට්ටුව මැතිතුමා

පසුගිය 09 වන දින රට තුල සිදු වූ ඛේදනීය සිදුවීම හෙලා දකින බව පැවසූ ගරු මන්ත්‍රීතුමා එම අවස්ථාවේ ඉතා සාමකාමී ලෙස කටයුතු කල ප්‍රදේශයේ ජනතාවට සිය ස්තුතිය ප්‍රකාශ කළේය.

අනතුරුව අදහස් දක්වමින්, පළුගහවෙල ගමේ පවුල් 16ක් පමණ ජීවත් වන අතර එම කොටස බඹරගල වසමට එක් කරන ලෙස ප්‍රදේශවාසීන්ගෙන් ඉල්ලීමක් ඇති බව පැවසූ මන්ත්‍රීතුමා ඒ සම්බන්ධව අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ඉල්ලා සිටියේය.

### 9.2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා

බල ප්‍රදේශයේ අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් විභාගය පවත්වන දිනයන්හි දී ප්‍රවාහන පහසුකම් සැලසීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ඉල්ලීමක් කල ගරු මන්ත්‍රීතුමා, පසුගිය 09 වන දින සිදුවූ සිදුවීමෙන් පසු මෙරට අග්‍රාමාත්‍ය ධූරය බාර ගැනීමට කිසිවෙකුත් ඉදිරිපත් නොවූ අවස්ථාවක රට වැටී ඇති අගාධයෙන් ගොඩ ගැනීමට ඉදිරිපත් වූ ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාට සිය සුභ පැතුම් එක්කරමින් රටේ පවතින ගැටළු නිරාකරණය කර ගැනීමට එතුමාට ශක්තිය ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනා කළේය.

තවද,මේ වන විට සංවර්ධන කටයුතු නවතා දමා ඇති බැවින් ඒ සඳහා යොදවා සිටි ආර්ථික සංවර්ධන නිලධාරීන් හරහා ගෙවතු වගා සංකල්පය ජනතාව අතරට රැගෙන යන වැඩ පිළිවෙලක් සැකසීම කාලෝචිත බව පැවසූ ගරු මන්ත්‍රීතුමා, මාර්ග සංවර්ධන අධිකාරිය සතුව සංවර්ධන කාර්යයන් සඳහා යොදා ගැනීමට රැස් කරන ලද භූමිතෙල් හා ඉන්ධන තොග ඇති බවට කරුණු අනාවරණය වී ඇති බැවින් එම සංචිත ජනතාවට ලබාදී සහනයක් සලසන වැඩපිළිවෙලක් සකස් කරන ලෙස ඉල්ලා සිටියේය.

තව දුරටත් අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමා බල ප්‍රදේශය තුල පීඩාවට පත් ජනතාව වෙනුවෙන් පාට පක්ෂ භේදයකින් තොරව දේශපාලන අරමුණු ඉටු කර ගැනීමට නොයා ජනතාවට හැකි සෑම අයුරකින්ම සහන සලසා දීමට සියලු දෙනා එක්ව කටයුතු කල යුතු බව පැහැදිලි කරමින් සිය දහස් දැක්වීම අවසන් කළේය.

### 9.3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය

ප්‍රාදේශි සභාවේ නව ලේකම්තුමියට සුභ පැතුම් එක් කරමින් හිටපු වැඩ බලන ලේකම් එස් රත්නාවතී මැණිකේ මැතිතුමිය සම්බන්ධයෙන් සිහිපත් කල ගරු මන්ත්‍රීතුමිය එතුමිය විසින් සභාවට සිදු කල සේවාව හා එතුමියගේ කැපවීම අගයමින් එතුමියට සිය ස්තුතිය පුද කල අතර එතුමියගේ අනාගත කටයුතු සාර්ථක කර ගැනීමට සුභ පැතුම් එක් කළාය.

එසේම පසුගිය 09 වන දින සිදු වූ සිදුවීම දැඩි සේ හෙලා දකින බව පැවසූ ගරු මන්ත්‍රීතුමිය ප්‍රදේශයේ ජනතාව එම අවස්ථාවේදී බුද්ධිමත්ව කටයුතු කල බවත්, තමන් ද පෞද්ගලිකව සභාවේ ගරු

සභාපතිතුමා ඇතුළු සහෝදර මන්ත්‍රී මණ්ඩලයේ ආරක්ෂාව සම්බන්ධයෙන් සොයා බැලූ බවත් සඳහන් කළාය.

## 9.4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්.කුමාර මැතිතුමා

ඉදිරියේදී එලඹෙන වගා කන්නය සඳහා පොහොර ගැටළුව කඩිනමින් විසඳිය යුතු බවත්, එසේ නොවන්නේ නම් අගෝස්තු, සැප්තැම්බර් වන විට රට තුල දැඩි ආහාර හිඟයක් ඇති වන බවත් පෙන්වා දුන් ගරු මන්ත්‍රීතුමා, රජයේ නිලධාරීන් ගෙවතු වගා සංකල්පය සඳහා යොදවා ගැනීමට රජය විසින් යම් ප්‍රතිපත්තියක් සැකසිය යුතු බවත්, සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලා වශයෙන් ඒ සඳහා ලබාදිය හැකි උපරිම සහයෝගය ලබා දීමට තමන්ද කැපවන බවත් සඳහන් කළේය.

එසේම මෙවර සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින දරුවන්ට සිය සුභ පැතුම් එක් කල ගරු මන්ත්‍රීතුමා, රටේ ජනතාව දැඩි පීඩනයකින් පසුවන බැවින් ජනතාව සමඟ ගනුදෙනු කිරීමේ දී කල්පනාවෙන් කටයුතු කල යුතු බවත් ඔවුන් පත්වී ඇති පීඩනය හේතුවෙන් ජනතාවට ප්‍රාදේශීය මට්ටමින් හෝ සහන ලබාදීමේ වැඩපිළිවෙලක් සකස් කල යුතු බවත් සඳහන් කල අතර මෙම අවස්ථාවේදී ජනතාවගේ බලාපොරොත්තුව අතිගරු ජනාධිපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය ඉවත් වී නව ස්ථාවර ආණ්ඩුවක් ගොඩනැගීම බැවින් එය ඉටු කල යුතු බව සඳහන් කළේය.

අවසාන වශයෙන් කරුණු දැක්වූ ගරු මන්ත්‍රීතුමා ජනතාවගේ සුභ සිද්ධිය වෙනුවෙන් ගන්නා ඕනෑම තීන්දු තීරණයක් සඳහා තමන් ඕනෑම විටෙක සයෝගය ලබාදෙන බව සඳහන් කළේය.

## 9.5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.දමිත් විජේරත්න මැතිතුමා

පසුගිය 9 වෙනි දින සිදු වූ සිදුවීම සම්බන්ධව අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමා එම අවස්ථාවේ බුද්ධිමත්ව කටයුතු කල බල ප්‍රදේශයේ ජනතාවට සිය ස්තූතිය පුද කළේය. එසේම මෙම වකවානුවේ ජනතාවට දේශපාලනඥයින් කෙරෙහි දැඩි පිළිකුලක් ඇති වී ඇති බවත් එය කලින් කලට පත් වූ දේශපාලනඥයින් විසින් ඇති කරන ලද්දක් බවත් පෙන්වා දුන් ගරු මන්ත්‍රීතුමා ඉදිරියේදී මැතිවරණ උදෙසා ගෙයින් ගෙට යාමටවත් නොහැකි තත්ත්වයක් රට තුල උද්ගත වී ඇති බව පෙන්වා දුන්නේය.

පසුගිය යහපාලන ආණ්ඩුවේ දී හොරුන් සහ වංචනිකයින්ට නිසි දඬුවම් ලබා දුන්නේ නම් අද මෙවැනි තත්ත්වයක් නිර්මාණය නොවනු ඇති බව වැඩිදුරටත් සඳහන් කල ගරු මන්ත්‍රීතුමා රට තුල පවතින මෙම ආර්ථික අර්බුදය හමුවේ බල ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් සභාවෙන් සිදුවිය යුතු සියලු සේවාවන් ලබාදීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටියේය.

එසේම පසුගිය සභා වාරයේ දී තමන් විසින් නීත්‍යානුකූලව නිවාඩු අනුමත කර ගනිමින් නිවාඩු ලබා ගත් බවත්, අත්‍යවශ්‍ය හේතූන් මත සභා රැස්වීම් සඳහා නොපැමිණියද ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයකු වශයෙන් තමන්ගෙන් ඉටුවිය යුතු යුතුකම් හා වගකීම් මැනවින් ඉටුකර ඇති බව පැවසූ ගරු මන්ත්‍රීතුමා රටේ පවතින සංවර්ධන කටයුතු නතරකර මෙම අවස්ථාවේ ජනතාවට සහන සැලසිය හැකි උපරිම ආකාරයෙන් සහන ලබාදිය යුතු බව පැහැදිලි කල අතර ඒ වෙනුවෙන් අවශ්‍ය ඕනෑම සහයක් ලබා දීමට සූදානම් බව ප්‍රකාශ කළේය.

## 9.6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික විරසිංහ මැතිතුමා

පසුගිය සභා වාරයේදී කුරගල සංවර්ධනයත් සමග බල ප්‍රදේශය ඓතිහාසික ස්ථාන සම්බන්ධයෙන් නාම පුවරු සකස් කර ජනතාවට සංචාරක ස්ථාන ඇති කල යුතු බවට තමන් විසින් යෝජනා කල අතර ඒ සඳහා කඩිනම් විසඳුම් මෙවනතෙක් ලැබී නොමැති බවත්, පසුගිය වෙසක් පොහොයට සමගාමීව අති විශාල ජනකායක් කුරගල ඓතිහාසික පුදබිමට පැමිණි අතර වැලිගෙපොල කොට්ඨාශයේ ඇති ඓතිහාසික ස්ථාන පිළිබඳ ප්‍රචාරණයක් නිසි පරිදි සිදු වූයේ නම් එම ප්‍රදේශ තුලද සැලකිය යුතු සංවර්ධනයක් සිදු වීමට ඉඩ තිබූ බව ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් පෙන්වා දෙන ලදී.

මෙම තත්වය ඉදිරියටත් පැවතිය හැකි බැවින් හැකි ඉක්මනින් තමන්ගේ යෝජනාව ක්‍රියාත්මක කිරීමේ වැඩපිළිවෙලක් සකස් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා වැඩිදුරටත් ඉල්ලා සිටියේය.

රටේ පවතින තත්වයත් සමග මේ වන විට දේශපාලනඥයින් සම්බන්ධව දැඩි කලකිරීමක් පවතින බව පෙන්වා දුන් ගරු මන්ත්‍රීතුමා, පසුගිය 09 වන දින සිදුවීම තමන් දැඩි සේ හෙලා දකින බවත්, එම අවස්ථාවේදී පෞද්ගලිකව තමන් පිළිබඳව සොයා බැලූ ගරු සහෝදර මන්ත්‍රීවරුන්ට සිය ස්තූතිය ප්‍රකාශ කල අතර ඉදිරියට දේශපාලන නායකයින් ගේ මත වාද තමන් විසින් පිළිනොගන්නා බවත් ජනතාව සමඟ හැකි සෑම විටම ඉදිරියට යාමට කටයුතු කරන බවත් සඳහන් කළේය.

## 9.7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.රත්නපාල මැතිතුමා

හඳගිරිගොඩ වසමේ වගා නොකල කුඹුරු ඉඩම් පවතින බැවින් හැකියාවක් පවතින අයෙක් ඉදිරිපත් වන්නේ නම් ගොවීන් සමග එක්ව මුං වැනි බෝග වර්ගයක් වගා කල හැකි බවත් විශාල ලෙස අස්වනු එමගින් ලබාගත හැකි බවත් පෙන්වා දුන් ගරු මන්ත්‍රීතුමා, රටේ පවතින ආහාර අර්බුදයට විසඳුමක් ලෙස මෙම යෝජනා ක්‍රියාත්මක කිරීම සුදුසු බව පෙන්වා දුන් අතර ඒ සම්බන්ධව ප්‍රාදේශීය ලේකම් ,කෘෂිකර්ම පර්යේෂණ නිලධාරීන් හා ගොවිජන සේවා නිලධාරීන් දැනුවත් කර කඩිනම් විසඳුමක් ලබාදෙන ලෙස ඉල්ලා සිටියේය.

## 9.8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා

පසුගිය 09 වන දින සිදුවූ සිදුවීම තමන්ද හෙලා දකින බව පැවසූ ගරු මන්ත්‍රීතුමා, තමන්ගේ ආරක්ෂාව සම්බන්ධව සොයා බැලූ සියලු දෙනාට සිය ස්තූතිය ප්‍රකාශ කළේය.

තවද ඕපනායක තැපැල් කාර්යාලය සඳහා වසර ගණනාවකින් නව තැපැල් කරුවන් බඳවා ගැනීමක් සිදු කර නොමැති බැවින්, වැඩි වන ජනගහනයට සාපේක්ෂව සිටින තැපැල් කරුවන් ප්‍රමාණවත් නොවීම මත ඇතැම් ප්‍රදේශ වලට ලිපි බෙදා දීම දවසක් හැර දවසක් සිදුවෙන බවත් ,ඒ තුළින් ජනතාව අපහසුතාවන්ට ලක් වී ඇති බවත් සඳහන් කල අතර ග්‍රාම නිලධාරී වසම් 25 ක් පමණ නියෝජනය කිරීමට තැපැල් කරුවන් හත් දෙනකු පමණක් සිටින හෙයින් තැපැල් කරුවන් දෙනකුවත් බඳවා ගැනීම සුදුසු බව පෙන්වා දුන් ගරු මන්ත්‍රීතුමා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී මේ සම්බන්ධව සාකච්ඡාවට ගන්නා ලෙසත් සබරගමුව පළාත් භාර නියෝජ්‍ය තැපැල්පති හා රත්නපුර දිස්ත්‍රික් ප්‍රාදේශීය තැපැල් අධිකාරී දැනුවත් කරන ලෙසත් ඉල්ලා සිටියේය.

## 9.9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා

පසුගිය 09 වන දින තමන් ඇතුළු පිරිස ගරු අග්‍රාමාත්‍යතුමාගේ ඉල්ලා අස්වීමේ අවස්ථාවට සහභාගී වූ අතර කිසිවිටෙකත් අරගලයකට එක් නොවූ බවත්, එවැනි ප්‍රචණ්ඩ ක්‍රියා තරයේ හෙලා දකින බවත් පැවසූ ගරු මන්ත්‍රීතුමා එම අවස්ථාවේදී බුද්ධිමත්ව ක්‍රියා කල ප්‍රදේශයේ ජනතාවට සිය ස්තූතිය ප්‍රකාශ කළේය.තව දුරටත් අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමා, විවිධ පුද්ගලයින් කුපිත කරවීමේ අරමුණින් සමාජ මාධ්‍ය ජාල හරහා ව්‍යාජ නම් ලයිස්තු ඉදිරිපත් කරමින් ක්‍රියා කල ද ප්‍රදේශයේ ජනතාව එම අවස්ථාවේ ඉතා බුද්ධිමත්ව ක්‍රියා කිරීම සම්බන්ධව නැවතත් සිය ස්තූතිය ප්‍රකාශ කළේය.

## 9.10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා

හල්ලින්න මාර්ගයේ තාවකාලිකව යොදා ඇති බොක්කුව කැඩී වලහැරී ඇති අතර ගමන් කිරීමට අපහසු වී ඇති බැවින් එය පිළිසකර කර දෙන ලෙස ඉල්ලා සිටි ගරු මන්ත්‍රීතුමා, සබරගමු අරුණැල්ල ව්‍යාපෘතිය යටතේ පළාත් සභාව මඟින් සිදුකල ව්‍යාපෘති සඳහා කොන්ත්‍රාත් මුදල් ලබා දී නොමැති බැවින් ඒ සම්බන්ධව සොයා බලා මුදල් ලබාදීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටියේය.

එසේම ගරු අග්‍රාමාත්‍ය තුමාගේ සමුගැනීමේ අවස්ථාවට ලද ආරාධනාව මත එයට සහභාගි වූ බවත් කිසිදු ප්‍රචණ්ඩ ක්‍රියාවකට සභාවේ කිසිදු මන්ත්‍රීවරයෙකු සහභාගි නොවූ බවත් පැවසූ ගරු මන්ත්‍රීතුමා ඉතා සාමකාමීව කටයුතු කල ප්‍රදේශයේ බුද්ධිමත් ජනතාවට සිය කෘතවේදීත්වය පල කළේය.

## 9.11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඒ.ඩබ්ලිව්.සුමනාවතී මැතිතුමිය

පසුගිය 9 වන දින සිදුවූ සිදුවීම ඉතා කණගාටුවට කරුණක් බවත් මෙදින සිදුවීමෙන් සහෝදර මන්ත්‍රී මණ්ඩලයට හානියක් සිදු නොවීම සතුටට කරුණක් බවත් පැවැසූ ගරු මන්ත්‍රීතුමිය තමන්ද හැකි අයුරින් ඔවුන් ගැන සොයා බැලූ බව සඳහන් කළාය.

තවද, කරගහයට බස් නැවතුම්පල ඉදි කිරීමට අවශ්‍ය බලධාරීන් දැනුවත් කරන ලෙස ගරු මන්ත්‍රීතුමිය විසින් ඉල්ලා සිටින ලදී.

## 9.12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා

ප්‍රාදේශීය සභාවේ ප්‍රදේශයේ ජනතාවගේ අත්‍යවශ්‍ය ගැටළු සම්බන්ධව නිරන්තරයෙන් සාකච්ඡා කරමින් අදාල බලධාරීන් දැනුවත් කල ද බොහෝවිට එම ගැටළු සම්බන්ධව කිසිදු අවධානයක් යොමු නොවීමේ ප්‍රතිඵලයක් ලෙස ජනතාව මෙසේ අරගලයන්හි යෙදීමට හේතු වූ බව පැහැදිලි කල ගරු මන්ත්‍රීතුමා, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකු ලෙස ජනතාව සමඟ සිටීමෙන් ජනතා මුදලින් වැටුප් ලබමින් ඔවුන් වෙනුවෙන් හඬ නැගීමට නොහැකි වීම ඉතා කණගාටුවට කරුණක් බව පැවසුවේය.

මෙම අර්බුද නිර්මාණය වූයේ අතිගරු ජනාධිපතිතුමාගේ ක්‍රියාකලාපය නිසා පමණක් නොව කාලයක් පුරා පවතින දේශපාලන ක්‍රමවේදයේ මැති ඇමතිවරුන්ගේ ක්‍රියාකලාපයන් නිසාවෙන් බව පැහැදිලි කල ගරු මන්ත්‍රීතුමා තම හෘදසාක්ෂියට එකඟව ජනතාවට සේවය කරන්නේ නම් මෙවැනි දේ සිදු නොවන බවත් හැකි සෑම විටම නිවැරදි පැත්ත ගත යුතු බවත් පැවසුවේය.

රට තුල පවතින දැඩි දේශපාලන අස්ථාවරත්වය හමුවේ ප්‍රාදේශීය සභාව තුලින් ජනතාවගේ මතය ට ඇහුම්කන් දෙමින් ජනතාව වෙනුවෙන් සේවා සපයමින් ආර්ථික අර්බුදයට මුහුණදීම සඳහා ග්‍රාමීය මට්ටමින් වැඩපිළිවෙලක් සකස් කර සහෝදරත්වයෙන් ඉදිරියට කටයුතු කල යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් පෙන්වා දෙන ලදී.

### සභා රැස්වීමේ නිමාව

පසුගිය 09 වන දින සිදු වූ සිදුවීම් සියල්ල තරයේ හෙලා දකින බවත්, තමන් ඇතුළු පිරිස කිසිවිටෙකත් එවැනි ක්‍රියා අනුමත නොකරන බවත් පැවසූ ගරු සභාපතිතුමා විවිධ අසත්‍ය ප්‍රචාර බල ප්‍රදේශය පුරා පැතිරුණ ද ප්‍රදේශයේ ජනතාව පාට පක්ෂ භේදයකින් තොරව තමන් විශ්වාස කල බවත් ගරු මන්ත්‍රීවරුන් ඇතුළු ප්‍රදේශයේ ජනතාව තමන් පිළිබඳව සොයා බැලූ බවත් එම අවස්ථාවේ බුද්ධිමත්ව ක්‍රියා කිරීම සම්බන්ධයෙන් සියළු දෙනාට සිය ගෞරවය හා ස්තුතිය ප්‍රකාශ කල ගරු සභාපතිතුමා සභාවේ අනන්‍යතාවයට හානිවන කිසිදු තීන්දු තීරණයන් තමන් විසින් කිසි විටෙකත් නොගන්නා බවත් ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා සියළු තීන්දු තීරණ සභාවේගරු මන්ත්‍රීතුමන්ලා සමඟ එක්ව සිදුකරන බවත් පැවසූ අතර සභා බල ප්‍රදේශයේ සෞභාග්‍යමත් ප්‍රදේශයක් බවට පත්කිරීම උදෙසා සියළු දෙනා එක්ව ඉදිරියට කටයුතු සිදු කල යුතු බව පෙන්වා දුන්නේය.අනතුරුව ගරු සභාපතිතුමා , අද දින රැස්වීමේ කටයුතු සාර්ථකව කරගෙන යාමට සහය ලබාදුන් සියළු දෙනාට සිය ස්තුතිය පුදකරමින් දහවල් 12.30 ට පමණ සභා රැස්වීමේ කටයුතු නිමාවට පත් කළේය.

කැළුම් ප්‍රියංකර ජයසිංහ,
සභාපති,
වැලිගෙපොල ප්‍රාදේශීය සභාව